4 වන පිටෙන්

ඔවුන්ගේ ම්ලේච්ඡ ක්‍රියාවන් ලෝක බලවතුන් හමුවෙහි අනාවරණය කරලා රටේ කීර්තිය රැක ගත්තා. මේ නිසා කොටින් අඩපණ වෙලයි හිටියේ. ඒත් එජාපයටත්, පොදු පෙරමුණටත් රටේ බලය ලබා ගන්න උඩරට වතුකරයේ දැවැන්ත ඡන්ද කන්ද වරින් වර එහාටත් මෙහාටත් තෑගී කරපු කොංග්‍රසයේ තොණ්ඩමාන්ම කියනවා නම් දකුණේ ආණ්ඩුව ජාතිවාදී එකක් කියලා ඒ කතාව ඉන්දියානු ආණ්ඩුව පිළිනොගෙන සිටීද? ලෝක බලවතුන් මෙච්චර කලත් පිළිනොගත් කොටින් ගහපු රැකෝඩ් ආයෙත් සැරයක් අහලා බලන්න නොපෙළඹෙයිද?

අනිත් පැත්තෙන් කොටි නායක ප්‍රභාකරන්ට මේ නම් පෑදුනේ ඉල්ලමක්. දැන් ප්‍රභාකරන්ට පුලුවන් තොන්ඩමාන් හරහා ආණ්ඩුවට බලපෑම් කරන්න. ඒ හරහා ජනතා විමුක්ති පෙරමුණෙන්, හෙළ උරුමයෙන් ජාතිවාදී හැඟීම් තව තවත් අවුස්සලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව අවුලෙන් අවුලට පත් කරවන්න. ඒ විතරක්ද? දැන් ප්‍රභාකරන්ට පුලුවනි තමන්ගේ අන්තර්ජාලය හරහා තොණ්ඩමාන්ගේ ප්‍රකාශ ජාත්‍යන්තරයට පතුරවා හරින්න. මහින්දගේ ආණ්ඩුව එරෙහිව දැඩි ප්‍රකාශ තොණ්ඩමන්ගේ කටින් එළියට ගන්නත් දැන් ප්‍රභාතරන්ට පුලුවනි. දකුණේ සියලුම දෙමළ සංවිධාන එක කුඩයක් යටම ගෙන එන්නට තොණ්ඩමන් හරහා ප්‍රභාකරන්ට දැන් ඉතා පහසුයි. භයානකම කාරණාව තමයි තොණ්ඩමන්ගේ බාධාවකින් තොරව වතුකරයේ කොටි අවි ගබඩා පිහිටුවන්නට අවශ්‍ය නම් ප්‍රභාකරන්ට ඉදිරියේදී හැක-වීමයි.

මේ කාරණාවලින් පෙනෙන්නේ මොකක්ද? සාමය වෙනුවට යුද්ධය අත වනනා බවක් නේද? කොටි දැන් උතුරෙත් නැගෙනහිරත් දිග්ටම මිනී මරන්න පටන් අරගෙන. හැබැයි ඒ මිනී මරන්නේ කොටි සංවිධානය නෙමෙයි කියලයි එයාලා කියන්නේ. නාඳුනන කල්ලියක්. මිනී මරන්-න්. මේ කල්ලිය 'විමුක්ති හමුදාව සහ ජනතා යුද පෙරමුණ' නමින් හඳුනා ගෙන තිබෙනවා. ඔවුන් කියනවා ඉදිරියේදී යාපනය අර්ධද්වීපය පුරා තිබෙන ග්‍රාම සේවක වසම් 528 දවසකට එක් වසමක් බැගින් ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ කරන බව. ඔය අතරේ ත්‍රිවිධ හමුදාපතිවරුන් ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවක් පවත්වලා ප්‍රකාශ කළා ''අපි සාමයටත් ලෑස්තියි, යුද්ධයටත් ලෑස්තියි කියලා.''

එක්සත් ජාතික පක්ෂයෙන් රනිල් වික්‍රමසිංහව පන්නා දැමීමේ සංග්‍රාමය දෙසැම්බර් මාසය පුරාම දකින්නට ලැබුණ දෙයක්. මිනි මරලා, ගෙවල් දොරවල් ගිනි තියලා ඡන්ද දිනපු සමහර දේශපාලනඥයන් සිටින එජාපයට රනිල්ගේ මහත්මා දේශපාලනය අල්ලන්නේ නෑ, පසුගිය ජනාධිපතිවරණයේදී දකුණේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවුණේ නැහැ. එජාපයේ දේශපාලනඥයෙක් ජනාධිපතිවරණයෙන් පස්සේ කිව්වා ''නායකයෝ වුණාම මිනියක් දෙකක් හරි මරලා බලය ගන්න ඕනේ කියලා.

ඒ වගේ මිනි මරලා, හොර තක්කඩි වැඩ කරලා ඡන්ද දිනන්න රනිල් සතුටු නැති බව පසුගිය මැතිවරණවලින් පෙනුණා. ඉතින් රනිල්ගේ මේ තාපස දේශපාලනයට විරුද්ධ එජාපයේ අංගුමාලි දේශපාලනඥයෝ රනිල්ව 'මාකට්' කරන්න බැහැයි කියනවා. ඒ හින්දලු 'ප්‍රසිඩන්ට් ඉලෙක්ෂන්' එක පරාද වුණේ.

හැබැයි මට නම් පේන්නේ රනිල්ට මාකට් කරන්න බැරි බවක් නෙමෙයි. එජාපයේ සිටින කට හැකර වාචාල දේශපාලකයන් දෙතුන් දෙනා පසුගිය කාලයේදී එජාපය විනාශ කරද්දී රනිල් නිහඬව සිටීමයි. එක ප්‍රශ්නයක් වුණේ. හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට ඉතා කැත විදිහට මොවුන් අපහාස කළා. මොවුන් ඇමැතිකම් දරපු රාජ්‍ය ආයතන බංකොලොත් කළා. එජාපයේ දක්ෂයන්, දක්ෂ කථිකයන් වෙනුවට එජාපය වෙනුවෙන් ජනතාව අතරට ගියේ වාචාල දේශපාලකයන්. ඔවුන්ගේ කුණුකතා අසා එජාප එහෙයියන් අත්පුඩි ගැසුවත් බුද්ධිමත් ජනතාව ඔවුන්ව ප්‍රතික්ෂේප කළා. රනිල්ට රට ගියොත් රට පාලනය කරන්නේ මේ අම්බරුවන් නේදැයි ජනතාව කල්පනා කළා. රනිල්ට ඒ බව කල්පනා වුණේ නෑ. රනිල්ට ඒ බවක් දැනුනත් ඒ වෙන කොටත් අසංවර දේශපාලන බලයෙන් මොවුන් කීපදෙනා පක්ෂයේ බලය අල්ලා ගෙනයි හිටියේ. රනිල්ටත් කරකියා ගන්න දෙයක් නැති වුණා. ජනාධිපතිවරණයට පෙරත් රනිල්ට එරෙහිව මොවුන් පෙනී සිටියත් ඉන් එහාට අඩියක් මොවුන් තිබ්බේ නැත්තේ සාමය මුල්කර ගත් ජාත්‍යන්තර සම්බන්ධීකරණයක් සහ ජාත්‍යන්තර පිළිගැනීමක් රනිල්ට තිබුණ නිසයි. කොයිහැටි වෙතත් තමන්ව 'මාකට්' කරන්න බැහැයි කියපු අම්බරුවන් හතරපස් දෙනා මීට අවුරුද්දකටවත් කලින් 'වෙන්දේසියේ විකුණා දැම්මා නම් එජාපයට ඒක ලොකු ශාන්ති කර්මයක් වෙන්න තිබුණා.

මොවුන් හතරපස් දෙනා දැන් හදන්නේ කරු ජයසූරියට බලය ලබා දෙන්නයි. ඒකට ප්‍රධාන හේතුව තමයි කරු රෙද්දෙන් සහ බැනියමින් සැරසුන පුද්ගලයෙක් වීම. මහින්ද රාජපක්ෂගේ කුරහන් සාටකයට සවනක් දිය හැක්කේ රෙද්දෙන්, බැනියමින් සැරසුණ කරුට බවයි මේ කීපදෙනාගේ අදහස. ඒ වගේම කරුට රටේ නායකකම ලබා දුන්නට පස්සේ ඔහුව මෙහෙයවන රිමෝට් කොන්ට්‍රෝලය මේ හතර පස්දෙනා අත තියා ගන්නයි අදහස. දැනට පෙනෙන්නේ ඒ විදිහට. හැබැයි ප්‍රේමදාස ජනාධිපතිතුමා මිය ගියාට පස්සේ ඩී.බී. විජේතුංගට ජනාධිපති පුටුවේ හිඳුවලා සමහරු කල්පනා කළේත් ඔය විදිහටමයි. ඒත් විජේතුංග ජනාධිපතිතුමා එජාපය සුද්ධ කරන්න පටන් ගත්තේ සොත්ති උපාලිගෙන්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලේ එජාපය විනාශ කරපු දේශපාලකයන්, උපදේශකයන්, අධ්‍යක්ෂකවරුන් සියලුදෙනා පන්නා රනිල් වික්‍රමසිංහට තැනක් හදා දීලා පුලුවන් තරමින් රටක් හදලා බොහොම කෙටි කාලයකින් චන්ද්‍රිකාට රටත් බාර දුන්නා. ඒ විදිහට බලන කොට විජේතුංගගෙයි, කරුගෙයි වෙනසක් නැහැ. මොකද හික්මීමක් නැති දේශපාලනයක් මේ දෙදෙනාම නොකළ නිසයි.

මේ වගේ දේශපාලන අලකලංචි මැද්දේ අද රටේ අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල තත්ත්වයක් පොඩ්ඩක් සොයා බැලුවා. ඒක වාර්තා වූණෝ මේ විදිහට.

ගෑස් සිලින්ඩරය දැන් රුපියල් 800 ට වැඩී
දර හොන්ඩරය රුපියල් 140 ත් පනී
හාල් කිලෝව රුපියල් 40 පන්නයි
පළමු කිලෝමීටරය සඳහා ත්‍රිවිල් ගාස්තුව රුපියල් 50 යි.
පිටිකිරි ඕනෑම වර්ගයක් රුපියල් 150 ට වැඩී
විදුලිය, ටෙලිෆොන් ගාස්තු ළඟදීම ඉහළ දමන්න සැරසේ.

**අනුර හොරේෂස්**

